2023.01.11 LG/EC/2023/002

නිමල් පුංචිහේවා මහතා,
එස්.බී. දිවාරත්න මහතා,
එම්.එම්. මොහොමඩ් මහතා,
කේ.පී.පී. පතිරණ මහතා,
පී.එස්.එම්. චාල්ස් මහත්මිය,
මැතිවරණ කොමිෂන් සභාව,
සමන් ශ්‍රී රත්නායක මහතා,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

ගරු සභාපතිතුමනි / කොමසාරිස්වරුනි / මැතිවරණ කොමසාරිස් ජනරාල්තුමනි,

**රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා ව්‍යවස්ථා විරෝධීව අනීතිකව සිය බලය පාවිච්චි කිරීම**

මැතිවරණ කොමිෂන් සභාව; ඔවුනට වස්ථාපිතව සහ පළාත් පාලන මැතිවරණ පනත (262 වන අධිකාරය - 5.(1) (2) ) හරහා ලැබී ඇති බලතල ප්‍රකාරව පළාත් පාලන මැතිවරණය ප්‍රකාශයට පත්කර ඇති අතර ඊට අදාලව පනතේ වගන්තියට අනුව තේරීම් භාර නිලධාරීන් පත්කිරීමට ක්‍රියාකර ඇත. ඒ අනුව තේරීම් භාර නිලධාරීන් සහ සහකාර තේරීම් භාර නිලධාරීන් ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 - 4(ආ) වගන්තියට අනුව සියලුම රාජ්‍ය නිලධාරීන්, ව්‍යවස්ථාපිත මණ්ඩල සංස්ථා ඇතුළු සියලුම රාජ්‍ය නිලධාරින් මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතු බව දක්වා ඇති අතර කිසිදු සාධාරණ හේතුවකින් තොරව මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් නොසලකා හැරීම, ඊට අනුව ක්‍රියා නොකිරීම වසර තුනක සිර දඬුවමක් සහ රුපියල් ලක්ෂයකට නොඅඩු දඩයක් හෝ ඒ දෙකම ලබා දිය හැකි වරදක් බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 උද.1 ආ වගන්තිය යටතේ දක්වා ඇත.

එවැනි පරිසරයක් තුළ පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකු වන රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පළාත් පාලන ඡන්ද විමසීමට අදාලව ඇප තැන්පත් බාර නොගන්නා ලෙසට සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලිපියක් හරහා දැන්වීම මගින් ඔහු දැන දැනම ව්‍යවස්ථාවේ 104 වගන්තිය උල්ලංඝනය කර ඇති බව පෙනීයයි. රාජ්‍ය පරිපාලන ක්‍රියාවලියේදී දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු සමස්ත පරිපාලනයට නායකත්වය දෙන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙවැනි වරදක් සිදුකිරීම සුළු කොට තැකිය නොහැක. විශේෂයෙන්ම ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය භාවිත වන මැතිවරණයක් ප්‍රකාශයට පත්කර තිබෙන මොහොතක පරිපාලන නිලධාරියෙකු මෙවැනි ලිපියක් නිකුත් කිරීම සමස්ත රාජ්‍ය සේවයටම අගෞරවයක් වන අතර අනාගතයට වැරදි පූර්වාදර්ශයක් සපයන්නකි.

තමාගේ ඉහළ නිලධාරීන් වැරදි උපදෙස් ලබා දෙන්නේ නම් හෝ ව්‍යවස්ථා විරෝධී උපදෙස් ලබා දෙන්නේ නම් ඊට එරෙහිව කටයුතු කිරීමට පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ලෙස ඔහු සමත් විය යුතුය.

එමෙන්ම මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු සාමාජිකයින් ගෙන් අප ඉල්ලා සිටින්නේ ඔබගේ විධානයන් වලට එරෙහිව කටයුතු කරන ලෙස සාධාරණ හේතුවකින් තොරව තේරීම් භාර නිලධාරින්ට උපදෙස් දීමට ක්‍රියා කළ අදාල අමාත්‍ය අමාත්‍යංශ ලේකම්වරයා සම්බන්ධයෙන් ව්‍යවස්ථා ප්‍රකාරව අවශ්‍ය නීතිමය පියවර ගන්නා ලෙසයි.

අපගේ මෙම ඉල්ලීම පුද්ගලානු බද්ධ සිදුවීමක් සම්බන්ධව නොවන අතර මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කිරීම උදෙසාත් මැතිවරණ කොමිෂන් සභාවේ ස්වාධීනභාවය ආරක්ෂා කිරීම උදෙසා රාජ්‍ය නිලධාරීන්ට ස්වාධීනව කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම උදෙසාත් වන බව කාරුණිකව සඳහන් කරමින් මේ සම්බන්ධයෙන් ඔබ ගනු ලබන තීරණ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ හැරවුම් ලක්ෂයක් වනු ඇති බවට සඳහන් කරමි.

මෙම සිදුවීම රටේ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි තීරණාත්මක තත්ත්වයක් උද්ඝත කරවන බැවින් රටේ මහජනතාවගේ දැනගැනීම පිණිස සියලුම මාධ්‍ය වෙත මෙම ලිපිය නිකුත් කරන බවද දන්වා සිටිමි.

ස්තුතියි,
මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ.

පිටපත් :

සභාපති, රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
සියලුම මාධ්‍ය ආයතන.
උනන්දුවක් දක්වන සෙසු පාර්ශව.

2023.01.11 LG/EC/2023/002

திரு. நிமல் புஞ்சிஹேவா,
திரு. எஸ்.பீ.திவாரத்ன,
திரு. எம்.எம். முகம்மட்,
திரு. கே.பி.பி.பத்திரண,
திருமதி. பி.எஸ்.எம். சால்ஸ்,
தேர்தல் செயலகம்,
சரண வீதி,
இராஜகிரிய.

கௌரவ தவிசாளர்/ஆணையாளர்கள்/தேர்தல் ஆணையாளர் நாயகம் அவர்களே !

**பொது நிருவாக மற்றும் உள்நாட்டலுவல்கள் அமைச்சின் செயலாளர் அரசியலமைப்புக்கு எதிராகவும், சட்டத்திற்கு முரணான வகையிலும் தனது அதிகாரத்தை பயன்படுத்தியமை தொடர்பானது**

தேர்தல் ஆணைக்குழுவுக்கு, அரசியலமைப்பு மற்றும் உள்ளூராட்சி சபை தேர்தல் சட்டத்தின் (262 ஆம் அத்தியாயம்) – 5.(1)(2) இல் வழங்கப்பட்டுள்ள அதிகாரங்களின் பிரகாரம் உள்ளூராட்சி தேர்தல் அறிவிப்புச் செய்யப்பட்டுள்ளதுடன், அதற்கு ஏற்புடைய சட்டத்தின் உறுப்புரைக்கமைய தெரிவத்தாட்சி அதிகாரிகளை நியமிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது. அதற்கமைய, தெரிவத்தாட்சி அதிகாரிகள் மற்றும் உதவித் தெரிவத்தாட்சி அதிகாரிகளின் நியமனம் வர்த்தமானி அறிவித்தல் மூலம் வெளியிடப்பட்டுள்ளது.

அரசியலமைப்பின் 104 – 4(ஆ) உறுப்புரைக்கமைய, அனைத்து அரச அலுவலர், எழுத்திலான சட்டத்திலான அரசாங்கத்திற்கு உரித்தாக்கப்பட்ட தொழில் முயற்சிகள் மற்றும் பகிரங்க கூட்டுத்தாபனங்கள் உள்ளிட்ட அனைத்து அரச அலுவலர்களும் தேர்தல் ஆணைக்குழுவின் ஆலோசனைகளுக்கமைய செயலாற்ற வேண்டுமெனக் குறிப்பிடப்பட்டுள்ளதுடன், எந்தவொரு நியாயமான காரணமுமின்றி தேர்தல் ஆணைக்குழுவின் ஆலோசனையை புறக்கணித்தல், அதற்கமைவான பணிப்புக்களின் கீழ் செயலாற்றாமைக்கான குற்றத்தீர்ப்புக்கு மூன்று வருட மறியற்தண்டனை மற்றும் ஒரு இலட்சம் ரூபாய்களுக்குக் குறையாத குற்றப்பணம் அல்லது குற்றப்பணமும் மறியற்தண்டனையும் வழங்கக்கூடிய குற்றமாக அரசியலமைப்பின் 104எஎ.1 இல் குறிப்பிடப்பட்டுள்ளது.

அவ்வாறான சூழலில் நிர்வாக சேவையில் சிரேஷ்ட அலுவலரான பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் செயலாளர், உள்ளூராட்சி தேர்தலுக்கு வைப்புத் தொகையை பொறுப்பேற்க வேண்டாமென அனைத்து மாவட்ட செயலாளர்களுக்கும் கடிதமூலம் அறிவித்தமை, அவர் நன்றாக அறிந்து கொண்டே அரசியலமைப்பின் 104 ஆவது உறுப்புரையை மீறியுள்ளமை தெரிய வருகின்றது. அரச நிர்வாக செயன்முறையில் மாவட்டச் செயலாளர்கள், பிரதேச செயலாளர்கள் உள்ளிட்ட ஒட்டுமொத்த நிர்வாகிகளுக்கும் தலைமைத்துவம் வகிக்கின்ற பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் செயலாளர் இவ்வாறான தவறை மேற்கொள்வதை கருத்திலெடுக்காது விடமுடியாது. குறிப்பாக மக்களுடைய உரிமையான தேர்தல் அறிவிக்கப்பட்டிருக்கும் இவ்வேளையில் நிர்வாக அதிகாரியொருவர் இவ்வாறான கடிதத்தை வெளியிடுவது ஒட்டுமொத்த அரச சேவையின் மதிப்பைக் குன்றச் செய்வதுடன், எதிர்காலத்தில் இதுவொரு தவறான முன்னுதாரணமாகவும் அமையும்.

தமது உயர் அதிகாரிகள் தவறான ஆலோசனைகளை வழங்குவதாயின் அல்லது அரசியலமைப்புக்கு எதிராக ஆலோசனை வழங்கும் போது நிர்வாக சேவை சிரேஷ்ட அதிகாரியாக அவர் அதற்கு எதிராக செயற்படல் வேண்டும்.


அத்துடன் தேர்தல் ஆணைக்குழுவின் தவிசாளர் உள்ளிட்ட அனைத்து அங்கத்தவர்களிடமும், தங்களுடைய பணிப்புக்களுக்கு எதிராக செயற்படுமாறு கூறி, நியாயமான காரணங்களை முன்வைக்காமல் தெரிவத்தாட்சி அதிகாரிகளுக்கு இவ்வாறான ஆலோசனை வழங்கிய குறித்த அமைச்சின் செயலாளர் தொடர்பாக அரசியலமைப்பின் பிரகாரம் சட்ட ரீதியான நடவடிக்கைகளை மேற்கொள்ளுமாறு வேண்டிக்கொள்கின்றோம்.

எமது இவ்வேண்டுகோள் தனிப்பட்ட பிரத்தியேகமான விடயமல்ல என்பதுடன், எமது நாட்டின் ஜனநாயகத்தைப் பாதுகாப்பதற்காகவும், தேர்தல் ஆணைக்குழுவின் சுயாதீனத்தன்மையை பாதுகாப்பதற்காகவும், அரச ஊழியர்களுக்கு சுயாதீனமாக செயலாற்றுவதற்குமான சூழலை உருவாக்குவதற்காகவே என்பதை தயவுகூர்ந்து குறிப்பிட்டுக் கூறுவதுடன், இவ்விடயம் தொடர்பாக தாங்கள் எடுக்கும் தீர்மானங்கள் நாட்டின் ஜனநாயகத்தின் திருப்புமுனையாக அமையும் என்பதையும் குறிப்பிட்டுக் கூற விரும்புகின்றேன்.

இச்சம்பவம் நாட்டின் ஜனநாயகத்தின் மீது தீர்மானம்மிக்க நிலையை உருவாக்குவதால், நாட்டு மக்கள் அனைவரும் அறிந்து கொள்ளும் வகையில் அனைத்து ஊடகங்களுக்கும் இக்கடிதத்தை வெளியிடுமாறு வேண்டிக்கொள்கின்றேன்.

நன்றி

இவ்வண்ணம்,



றோஹண ஹெட்டியாராச்சி
நிறைவேற்றுப் பணிப்பாளர்

பிரதிகள் :

தவிசாளர் : அரச சேவைகள் ஆணைக்குழு
அனைத்து ஊடக நிறுவங்கள்
ஆர்வங் காட்டுகின்ற ஏனைய தரப்பினர்கள்

2023.01.11

LG/EC/2023/002

Mr. Nimal Punchiheva,
Mr.S.B. Divaratne,
Mr. M.M Mohammed,
Mr. K.P.P. Pathirana,
Mrs.P.S.M. Charles,
Election Commission,
Mr. Saman Sri Ratnayake,
Election Secretariat,
Sarana Mawatha,
Rajagiriya.

Honorable Chairman / Commissioners / Commissioner General of Elections,

Unconstitutional & illegal exercise of power by the Secretary to the Ministry of Public Administration and Home Affairs

The Election Commission, in terms of the powers vested in it by the Constitution and the Local Authorities Elections Ordinance (section 262- 5. (1) (2) has announced the Local Authorities Election, and proceeded with the appointment of Returning Officers. Accordingly, the National Election Commission has issued an extraordinary gazette notice appointing the Returning Officers and Assistant Returning Officers to conduct the Local Government election. According to Article 104 - 4(b) of the Constitution, all public officials, including statutory boards and corporations, must act in accordance with the instructions of the Election Commission and as per Article 104 GG.1 (b) of the Constitution that the failure to comply with directions or guidelines issued by the Commission relating to the holding of an election, without a reasonable cause, shall be guilty of an offence, and on conviction be liable to a fine not exceeding one hundred thousand rupees or to imprisonment for a term not exceeding three years or to both.

Against this background , it appears that the Secretary to the Ministry of Public Administration, Home Affairs, Local Government and Provincial Councils, who is a senior official in the administrative service, has knowingly violated the Section 104 of the Constitution by directing all District Secretaries through a letter, not to accept the candidate's deposits related to the local government election. Commitment of such an offense by the Secretary to the Ministry of Public Administration & Home Affairs, who leads the entire system of Public Administration including the District Secretaries and Divisional Secretaries, cannot be overlooked as a lesser offense. Issue of such a circular by a senior administrative officer particularly at a time when the election has already been announced in which the democratic right of the people is supposed to be exercised, is a matter of disrespect to the entire public service which is liable to set a wrong precedent for the future.


If he had acted on wrong instructions or directives given by his superiors, which are contrary to the constitution, as a senior official in the administrative service, he should have been able to take apposite action against the former. Under the circumstances, we request the Chairman and the members of the Election Commission to institute appropriate legal action as per the Constitution, against the Secretary to the Ministry of Public Administration and Home Affairs for instructing the Returning Officers to act against your orders without a reasonable cause.

Please be informed that this request is made not with any subjective concerns , but with the view to creating the necessary environment to enable the public officials to discharge their responsibilities freely and independently thereby securing the democracy of this country and protecting the independence of the Election Commission. We wish to emphasize that the decision you take in this regard will be a turning point of democracy in our country.

We wish to inform you that this letter will be released to all the media to be published for public knowledge considering the critical impact of this incident on country's democracy,

.

Thank you,



Rohana Hettiarachchi

Executive Director.

Copies:

Chairman, Public Service Commission.

All media institutions.

Other interested parties.